**ජාතික පාසල් පවුර - ශ්‍රී ජයවර්ධනපුර අධ්‍යාපන කලාපය**

**පළමු වාර පරීක්ෂණය - 2019**

ජාතික පාසල් පවුර, ශ්‍රී ජයවර්ධනපුර අධ්‍යාපන කලාපය - ජාතික පාසල් පවුර, ශ්‍රී ජයවර්ධනපුර අධ්‍යාපන කලාපය - ජාතික පාසල් පවුර, ශ්‍රී ජයවර්ධනපුර
ජාතික පාසල් පවුර, ශ්‍රී ජයවර්ධනපුර අධ්‍යාපන කලාපය - ජාතික පාසල් පවුර, ශ්‍රී ජයවර්ධනපුර අධ්‍යාපන කලාපය - ජාතික පාසල් පවුර, ශ්‍රී ජයවර්ධනපුර

| 9 ශ්‍රේණිය | ගණිතය | කාලය - පැය 02 |
|---|---|---|

ජාතික පාසල් පවුර, ශ්‍රී ජයවර්ධනපුර අධ්‍යාපන කලාපය - ජාතික පාසල් පවුර, ශ්‍රී ජයවර්ධනපුර අධ්‍යාපන කලාපය - ජාතික පාසල් පවුර, ශ්‍රී ජයවර්ධනපුර

නම - ..............................................................................................................


## I කොටස

- 1 සිට 20 තෙක් ප්‍රශ්න සියල්ලටම මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.
- එක් ප්‍රශ්නයකට ලකුණු 2 බැගින් හිමිවේ.

1) 8, 11, 14 ................ යන සංඛ්‍යා රටාවේ පොදු අන්තරය සොයන්න.

2) වෙළෙන්දෙක් රු. 500 කට මිලදී ගත් කමිසයක් රු. 500 කට විකුණනු ලබයි. විකිණීමෙන් ලබන
   i. ලාභය කොපමණද?
   ii. ලාභ ප්‍රතිශතය කීයද?

3)





AB සරල රේඛාවකි.
P හි අගය සොයන්න.

4) සාධාරණ පදය වන $Tn = 5n - 3$ සංඛ්‍යා රටාවේ 10 වන පදය ලියන්න.

5) $12 - (-5)$ අගය සොයන්න.

6) 3 km න් $\frac{1}{6}$ ක් යනු මීටර කීයද?

7)





$(a + b)$ හි අගය සොයන්න.

8) $x = \frac{2}{3}$ ද $y = (\frac{-1}{2})$ ද වන විට $6x - 4y$ හි අගය සොයන්න.

9) $(x + a)(x + 5) = x^2 + bx + 15$, නම් $a$ හා $b$ හි අගය සොයන්න.


10)




රූපයේ දක්නට ලැබෙන බද්ධ කෝණ යුගල් 2ක් නම් කරන්න.

To download past papers visit

11)




$a$ හි අගය සොයන්න.


12) $3x - 5 = 10$ ප්‍රත්‍යක්ෂ ඇසුරින් විසඳන්න.

13) $64 \div (6 + 2 - 4) \times 5$ අගය සොයන්න.

14) රු. 330 කට සීනි 3 kg මිලදී ගතහැකි නම් සීනි 500 g ක මිල සොයන්න.

15) $ax - 8a + 4x - 32$ සාධක සොයන්න.

16)




ත්‍රිකෝණයේ වර්ගඵලය සොයන්න.

17) 24, 12 හා 30 හි මහා පොදු සාධකය සොයන්න.

$24 = 2 \times 2 \times 2 \times 3$

$12 = 2 \times 2 \times 3$

$30 = 2 \times 3 \times 5$

ම.පො.ස. =

To download past papers visit
www.vajirapani.blogspot.com

18) $3\frac{1}{3} \div 1\frac{1}{9}$ සුළු කරන්න.

19) 1 සිට 100 තෙක් ඇති සංඛ්‍යාවල එකතුව සංඛ්‍යා එකතු කිරීමක් නොකර සොයන්න.

20) $1\ m^3$ ඇති ලීටර ගණන කොපමණද?

$(M = 2 \times 20)$


## II කොටස

- පළමු ප්‍රශ්නයට හා තවත් ප්‍රශ්න 4කට පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 16 ක්ද අනෙක් ප්‍රශ්න සඳහා එක් එක් ප්‍රශ්නයට ලකුණු 11 බැගින් ද හිමි වේ.

1) a) i. එදිනෙදා ජීවිතයේදී ප්‍රතිශත භාවිතා වන අවස්ථා 2ක් සඳහන් කරන්න. (ලකුණු 02)

ii. වට්ටමක් යන්න පහදන්න. (ලකුණු 02)

b) එක්තරා වෙළඳසැල් 2ක ප්‍රදර්ශනය කර තිබූ දැන්වීම් පහත දැක්වේ.




To download past papers visit
www.vajirapani.blogspot.com

i. රු. 2500 ක් ලෙස මිල ලකුණු කර ඇති අත් බෑගයක් A වෙළඳසැලෙන් මිලදී ගැනීමේ දී ගෙවිය යුතු මුදල කොපමණද? (ලකුණු 03)


ii. එම වටිනාකම සහිත අත් බෑගයක් B වෙළඳසැලෙන් මිලදී ගත්තේ නම් ගෙවීමට සිදුවන මුදල කොපමණද? (ලකුණු 02)

iii. B වෙළඳසැලෙන් එම බෑගය මිලදී ගැනීමේ දී ලැබෙන වට්ටම් ප්‍රතිශතය කොපමණද? (ලකුණු 02)

iv. අත් බෑගය කවර වෙළඳසැලෙන් මිලදී ගැනීම වඩා වාසිදායකද? (ලකුණු 02)

c) වාහනයක් විකිණීමේ දී 4% ක කොමිස් මුදලක් අය කරයි. අය කරන ලද කොමිස් මුදල රු. 30,000 නම්, වාහනය විකුණුම් මිල කොපමණද? (ලකුණු 3)

2)



එක්තරා පහන් වැටක පහන් පිළිවෙල කර තිබුණේ ඉහත ආකාරයටය. එහි ඇතුලතම අඩ කවයේ පහන් 5 ක් ද, දෙවන අඩ කවයේ පහන් 9 ක් ද, තුන්වන අඩ කවයේ පහන් 13 ක් ද වන ලෙස රටාවකටය. එය අඩ කළ 9කින් සමන්විතය.

i. ඇතුලත සිට මුල් අඩකව 3 හි ඇති පහන් ගණන කීයද? (ලකුණු 02)

ii. n වන කවයේ ඇති පහන් ගණන සෙවීම සඳහා ප්‍රකාශනයක් ගොඩනගන්න. (ලකුණු 03)

iii. ඉහත ලබාගත් සාධාරණ පදය ඇසුරින් අවසාන කවයෙහි ඇති පහන් ගණන සොයන්න. (ලකුණු 03)


iv. පහන් 20 ක් ඇති කවයක් තිබිය නොහැකි බව පෙන්වන්න. (ලකුණු 03)

3) i. දශමය සංඛ්‍යා පද්ධතියේ සංඛ්‍යා ලිවීමට භාවිතා කරන සංඛ්‍යාංක ගණන කීයද? ඒ මොනවාද? (ලකුණු 02)

ii. ද්වීමය සංඛ්‍යා පද්ධතියේ සංඛ්‍යා ලිවීමට භාවිතා කරන සංඛ්‍යාංක ගණන කීයද? ඒ මොනවාද? (ලකුණු 02)

iii. 63 සංඛ්‍යාව දෙකේ පාදයෙන් දක්වන්න. (ලකුණු 02)

iv.





ගණක රාමුවෙන් නිරූපිත සංඛ්‍යාව ලියන්න. (ලකුණු 02)

v. $10111_{දෙක} + 1011_{තුන} - 11_{දෙක}$ අගය සොයන්න. (ලකුණු 02)

To download past papers visit
www.vajirapani.blogspot.com

4)




සෘජුකෝණාස්‍රාකාර පොකුණක පළල මීටර $x$ ද, දිග පළලට වඩා මීටර 2ක් ද වැඩිය. පොකුණ වටා 1m පළලට තණ පිඩලි අල්වා ඇත.

i. පොකුනෙහි දිග $x$ ඇසුරෙන් ලියන්න. (ලකුණු 01)

ii. පොකුණ සමග තණ පිඩලි ඇල්ලූ කොටසේ

දිග ..........

පළල .......... සොයන්න. රූපය මත ලකුණු කරන්න. (ලකුණු 03)

(ඔබගේ පිළිතුරු පත්‍රයේ රූපය අඳින්න.)

iii. තණපිඩලි සමග පොකුනෙහි වර්ගඵලය සඳහා ප්‍රකාශනයක් ලියා සුළු කරන්න. (ලකුණු 02)

iv. පොකුණේ වර්ගඵලය සඳහා ප්‍රකාශනයක් ලියා සුළු කරන්න. (ලකුණු 01)

v. ඉහත (iii), (iv) පිළිතුරු ඇසුරෙන් තණ පිඩලි ඇල්ලූ කොටසේ වර්ගඵලය සඳහා ප්‍රකාශනයක් ලබාගන්න. (ලකුණු 02)

vi. $x = 2$ මීටර නම් තණ පිඩලි ඇල්ලූ කොටසේ වර්ගඵලය කොපමණද? (ලකුණු 02)

5) a) i. $2\frac{5}{8}$ විෂම භාගයක් ලෙස දක්වන්න. (ලකුණු 01)

To download past papers visit
www.vajirapani.blogspot.com

ii. $\frac{3}{7}$ හි පරස්පරය ලියන්න. (ලකුණු 01)

iii. $(\frac{2}{3} - \frac{1}{2})$ න් $(1\frac{2}{5} \div 2\frac{1}{3})$ සුළු කරන්න. (ලකුණු 04)


b) කමල් ගමනක් යාමේ දී මුළු දුරින් $^2/_3$ ක් ත්‍රීවීලරයකින් ද, $^2/_9$ බසයෙන් ද ගොස් ඉතිරිය පයින් යයි. ඔහු පයින් ගිය දුර 1 km නම්,

i. ත්‍රීවීලරයකින් සහ බසයෙන් ගිය දුර මුළු දුරින් කොපමණද? (ලකුණු 02)

ii. පයින් ගිය දුර මුළු දුරින් කොපමණද? (ලකුණු 01)

iii. ගමනේ මුළු දුර කොපමණද? (ලකුණු 02)

6) i. මූලික ප්‍රත්‍යක්ෂ 2ක් ලියන්න. (ලකුණු 02)




To download past papers visit www.vajirapani.blogspot.com

ii. රූපය ඇසුරින් හිස්තැන් පුරවන්න.

$q$ = .............................. (.................... කෝණ)

$P + 70$ = .............................. (.................... කෝණ)

$P$ = ..............................

$S$ = ........................ + 50 (ඒකාන්තර කෝණ)


$S$ = ..............................

$t$ = $q$ (.................... කෝණ)

$r + s$ = .............................. (මිත්‍ර කෝණ)

$\therefore$ $r$ = .............................. (ලකුණු 06)

iii.




රූපයේ දී ඇති දත්ත අනුව $x = y$ බව පෙන්වන්න. (ලකුණු 03)

7) a) නිවසක ඇති ජල ටැංකියක දිග, පළල සහ උස පිළිවෙලින් 1.5m. 1m සහ 90 cm වේ.

i. ටැංකියේ දිග, පළල සහ උස අතර අනුපාතය ලියා සරලම ආකාරයෙන් දක්වන්න. (ලකුණු 02)

ii. ජල ටැංකියේ පරිමාව කොපමණද? (ලකුණු 03)

iii. ජල ටැංකියේ ධාරිතාව ලීටර කීයද? (ලකුණු 02)

iv. පුද්ගලයෙකු දිනකට ජලය ලීටර 150 ක් භාවිතා කරයි නම් එම ජල ප්‍රමාණය දිනකට පුද්ගලයින් කී දෙනෙකුට සෑහේද? (ලකුණු 02)

b) $2a^2 - 18$ හි සාධක සොයන්න. (ලකුණු 02)

PARCEL NO

LOL.lk
BookStore

# විභාග ඉලක්ක
## පහසුවෙන් ජයගන්න

ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න






කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් සඟරා | O/L ප්‍රශ්න පත්‍ර |
A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් |
School Book ගුරු අතපොත්

PADANAMA PUBLICATION | pesuru Prakashana Private Ltd. | Akura Pilot | සමනල දැනුම | T | සතර

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා

**සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට**

www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න